(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 163.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 ජනවාරි මස 20 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0658/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රටේ මූල්‍ය කටයුතු සහ රෙගුලාසි අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ආයතනය කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කරන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට මේ දක්වා බංකොලොත්භාවයට පත්ව ඇති මූල්‍ය සමාගම්හි බංකොලොත්භාවයට හේතු වූ කාරණා කවරේද;

(ii) ඉහත කී මූල්‍ය සමාගම් අයහපත් ආකාරයකින් පවත්වාගෙන යමින් තිබියදී ඒ සම්බන්ධයෙන් මහ බැංකුවේ අධීක්ෂණ ඒකකය විසින් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අසාර්ථක වූ මූල්‍ය සමාගම් විසින් ගෙවීම් පැහැර හරිනු ලැබ ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මුදල් ආපසු ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව කවරේද;

(iii) ඔවුන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත කී කාල පරිච්ඡේදය තුළ මහ බැංකුවේ අධිපති ධූරය දැරූ තැනැත්තාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/'11

2.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා දකුණු කොරියාව වෙත යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දකුණු කොරියාවේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය මගින් ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1574/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඌව හයිලන්ඩ් වත්තේ, වතු කම්කරු පවුල් දාහතකගේ පමණ නිවාස අලුත්වැඩියා නොකිරීම සහ කඳු නායයාම හේතුවෙන් විනාශ වීම නිසා, ඔවුන් දැනට මාස කිහිපයක සිට කෝවිලක තනාගත් තාවකාලික කඳවුරුවල ජීවත් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම දරු පවුල්වල ජීවිත සුරක්ෂිත කිරීම සඳහා නව නිවාස ලබාදීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, නව නිවාස ලබා දෙන ප්‍රදේශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඌව හයිලන්ඩ්වත්තේ මෙම වතු කම්කරු පවුල් සඳහා නිවාස ලබා නොදෙන්නේ නම්, සුදුසු ස්ථානයකින් බිම් කැබැල්ලක් හෝ ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම් ලබා දෙන ප්‍රදේශය කවරේද;

(iii) ඉඩම් ලබා දීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1610/'11

4.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පානදුර මහේස්ත්‍රාත් නිල නිවස පිහිටි පානදුර වෙරළ උද්‍යානය අසල තිබූ ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) එම ඉඩමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එකී නිල නිවස 2004.12.26 වැනි දින සිදුවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් හානියට පත්වූයේද;

(iv) හානියට පත් නිල නිවස සහ මායිම් තාප්පය අලුත්වැඩියා කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පානදුර මහේස්ත්‍රාත් නිල නිවාසය සහ එය පිහිටි ඉඩම පෞද්ගලික ආයතනයකට ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බදු දී ඇති බවත්;

(ii) මේ වන විට පානදුර මහේස්ත්‍රාත්වරයාට නිල නිවාසයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත බඳු දීම නිර්දේශ කළ අය හා ඒ සඳහා අනුමතිය ලබා දුන් අය කවුරුන්ද;

(ii) ඊට අදාළ බඳු ගිවිසුම සභාගත කරන්නේද;

(iii) ඉහත කී දේපළෙහි සන්තකය අත්සතු කිරීමේදී අක්‍රමිකතාවයක් සහ හෝ දූෂණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඊට වගකිවයුතු තැනැත්තන්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1691/'11

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව රාජ්‍ය හා පෞද්ගලික සේවා ආයතන සමඟ එකඟ වී ඇති සේවා ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් ඇති කරගත් ආයතන කවරේද;

(iii) එම ගිවිසුම් ඇතිකර ගැනීමට හේතු කවරේද;

(iv) එක් එක් ආයතනයට අදාළව ඇති කර ගත් සේවා ගිවිසුම් ආරම්භ වූ දින සහ අවසාන වන දින කවරේද;

(v) එම ගිවිසුම් ඇති කර ගැනීම සඳහා අනුමතිය ලබාදුන් අය කවුරුන්ද;

(vi) එම ගිවිසුම් යටතේ තැපැල් දෙපාර්තමේන්තුවට ලැබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1807/'11

6.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වායු විමෝචන ප්‍රමිති සහතිකය ලබා දිය හැකි මෙරට ලියාපදිංචි ආයතන කවරේද;

(ii) එක් මෝටර් රථයක් සඳහා වායු විමෝචන ප්‍රමිති සහතිකය ලබා ගැනීම සඳහා වැය කළ යුතු මුදල කොපමණද;

(iii) පසුගිය වර්ෂය තුළ අදාළ ආයතන විසින් නිකුත් කර ඇති ප්‍රමිති සහතික සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රථ වාහන මගින් සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා, මෝටර් රථ වාහන ලබා ගත යුතු වායු විමෝචන සහතිකය ව්‍යාජ ලෙස ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) නීත්‍යානුකූල නොවන පරිදි නිකුත් කළ ව්‍යාජ ප්‍රමිති සහතිකපත් ලබා දෙන්නන් සහ ලබා ගන්නන් නීතියට හසුකර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න පිළිබඳව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1848/'11

7\.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ මුස්ලිම් මරණ පරීක්ෂණ පැවැත්වීම සඳහා මුස්ලිම් හදිසි මරණ පරීක්ෂකවරයෙක් නොමැති බවත්;

(ii) එම හේතුවෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල, වැල්ලවාය, බුත්තල, බඩල්කුඹුර, මැදගම සහ බිබිල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත්වන මුස්ලිම් ජනතාව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ප්‍රදේශවල මුස්ලිම් ජනතාවගේ අවශ්‍යතාව අනුව මුස්ලිම් හදිසි මරණ පරීක්ෂකවරයෙක් පත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/'11

8\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ ඇති සියලුම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස තුළ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිවී තිබේද;

(ii) නොඑසේ නම්, සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම කොට්ඨාසවල නම් කවරේද;

(iv) දැනට සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති කොට්ඨාසවලට සෞඛ්‍ය මධ්‍යස්ථාන ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2078/'11

9\.
ගරු අබ්දුල් හලීම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස කටයුතු කරන ඒ. එච්. එම්. නසීර් මහතා 2012 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ද්‍රවිඩ භාෂාව ව්‍යවහාර කරන මුස්ලිම් හා දෙමළ බහුතර ජනතාවක් (68%) වාසය කරන අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ද්‍රවිඩ භාෂාවෙන් රාජකාරි කළ හැකි ප්‍රාදේශීය ලේකම්වරයෙකු පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0765/'10

10\.
ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සිය මෙහෙයුම් ආරම්භ කළ දිනය, ඒ සඳහා යොදවන ලද ආරම්භක ප්‍රාග්ධනය සහ අද වනවිට ආයෝජනය කර ඇති මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(ii) අයවැය ලේඛන මගින් මිහින් එයාර් ගුවන් සේවය සඳහා ලබා දෙන ලද මුදල් ප්‍රමාණයන් සහ එලෙස මුදල් වෙන්කර දෙන ලද දිනයන් කවරේද;

(iii) එම ගුවන් සේවයේ ගිණුම්වලින් කපා හරිනලද මුදල් ප්‍රමාණය සහ එලෙස මුදල් කපා හැරීම සිදුකළ දිනය කවරේද;

(iv) ණය වශයෙන් ලබාදෙන ලද ප්‍රාග්ධනය සහ එලෙස ණය ප්‍රදානය කරන ලද බැංකුවල නම් සහ ණය ප්‍රදානය කරන ලද දිනයන් කවරේද;

(v) වසරකට ණය ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මිහින් එයාර් ගුවන් සේවය මගින් වසරකට ප්‍රවාහනය කරනු ලබන මුළු මගීන් සංඛ්‍යාව සහ භාණ්ඩ ටොන් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට එකී ගුවන් සේවය මගින් වසරකට උපයනු ලබන ආදායම කොපමණද;

(iii) මිහින් එයාර් ගුවන් සේවය ලාභදායී මට්ටමකින් පවත්වා ගෙන යාමට ප්‍රවාහනය කළ යුතුව තිබෙන මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) අද වනවිට එකී ගුවන් සේවය මගින් ප්‍රවාහනය කිරීමට සමත්ව ඇති මගී සංඛ්‍යාව හා භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජය මිහින් එයාර් ගුවන් සේවය සඳහා කිසියම් බැංකු ඇපකර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවායේ වටිනාකම සහ ඒවා ලබාදීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/'11

11.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, පුස්සැල්කඩ ආදර්ශ කණිටු විදුහලේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1577/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට වර්ෂ හතරකට පෙර ඉදිකිරීම් නිමකළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොළ, ගලගෙදර පිහිටි වයඹ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය මේ දක්වා ජනතා අයිතියට පවරා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි ඉදිකිරීම් කටයුතු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා දේශීය හෝ විදේශීය වශයෙන් සපයා ගන්නා ලද අරමුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිකිරීම් අවසන්වූ දින සිට මේ දක්වා එම මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිකිරීම් අවසන්ව ඇති වයඹ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ජනතා අයිතියට නොපැවරීමට හේතු කවරේද;

(ii) එය කඩිනමින් ජනතා අයිතියට පැවරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1692/'11

13\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිනිපේ යෝධ ඇළ ව්‍යාපාරය යටතේ ඇති කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම කුඹුරුවලින් මෙම කන්නයේදී වී වගා කරන ලද කුඹුරු ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) වගා කරන ලද කුඹුරු සඳහා නිසි කාලයේ දී ජලය නිදහස් කිරීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ජලය නිදහස් කළ දින සහ ඒ යටතේ ජලය ලබා ගන්නා ලද ප්‍රදේශ කවරේද;

(v) නිසි කාලයේදී ජලය නිදහස් කිරීමක් සිදු නොවූයේ නම්, එයට හේතු කවරේද;

(vi) ජලය නිදහස් නොකිරීමේ හේතුව මත කුඹුරු විනාශ වූයේ නම්, අදාළ කුඹුරු හිමියන් වෙත වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන්කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2047/'11

14\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ තිබෙන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කොට්ඨාස තුළ ක්‍රියාත්මක රජයේ සෞඛ්‍ය සේවා ආයතනවලින් සේවාවන් ඉටුකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එක් එක් සෞඛ්‍ය සේවා කොට්ඨාසයට වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2079/'11

15.

ගරු අබ්දුල් හලීම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 35 අතරින් කොට්ඨාස 20 කම වසන ජනතාවගෙන් බහුතරයක් (95%) ද්‍රවිඩ භාෂාව ව්‍යවහාර කරන බවත්;

(ii) එහෙත් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කරනුයේ ද්‍රවිඩ භාෂාවෙන් රාජකාරී කළහැකි ග්‍රාම නිලධාරීන් 6 දෙනෙකු පමණක් බවත්;

(iii) මේ වන විට අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු 5 ක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(ii) නව ග්‍රාම නිලධාරී පත්වීම් ලබාදීමේදී ද්‍රවිඩ භාෂාවෙන් රාජකාරී කළ හැකි නිලධාරීන් අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට බඳවා ගැනීමටත් අදාළ ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත කිරීමටත් කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2012 පෙබරවාරි මස 08 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

2.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වැලන්හින්න වාවිස්සර ජාත්‍යන්තර සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,—2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 26 දිනැති අංක 1725/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2011.11.28 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2012.01.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

3.

සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

4.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

5.

කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

6.

එස්. බී. නාවින්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*8.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*9.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජූලි 27 දිනැති අංක 1716/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*13.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදී.

*16.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

17.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1146/’11

1.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මගින් සයිප්‍රසයට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සයිප්‍රසයේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට් පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'11

2.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මගින් ලිබියාවට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලිබියාවේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට්පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1148/'11

3.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 ඔක්තෝබර් දක්වා රජය මගින් ජපානයට යවන ලද ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පිරිස අතරින් පුහුණු ශ්‍රමිකයින් සහ නුපුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්, දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජපානයේ රැකියාවකට යවනු ලැබූ එක් පුද්ගලයෙකුගේ ගුවන් ටිකට්පතක වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකමින් එක් පුද්ගලයකුගෙන් අය කළ මුදල කොපමණද;

(iii) රජය ලබාදුන් කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1429/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාලු කොටුව සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන 'ගාලු උරුමය පදනම' ආරම්භ කළ දින සිට මේ දක්වා වාර්ෂිකව එක් එක් ආයතනයෙන් ලැබුණු අරමුදල් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාලු උරුමය පදනමට ස්වාධීනව ආදායම් උපයා ගන්නා මාර්ග තිබේද;

(ii) එසේ නම්, එම ආදායම් උපයා ගන්නා මාර්ග සහ එම ආදායම් උපයා ගැනීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම එක් එක් ආදායම් මාර්ග තුළින්, එක් එක් වර්ෂයේදී උපයාගත් අදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාලු කොටුව තුළ ඡායාරූප ගැනීමේදී සහ චිත්‍රපටි, ටෙලි නාට්‍ය හෝ වාර්තා වැඩසටහන් රූ ගත කිරීමේදී මුදල් අය කරන්නේද;

(ii) එසේ නම්, මුදල් අය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එලෙස මුදල් අය කිරීමේ අරමුණ කවරේද;

(iv) එවැනි මුදල් අයකිරීම් මඟින් මේ දක්වා උපයා ගන්නා ලද මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම මුදලින් එක් එක් වර්ෂයේදී වැයකරන ලද මුදල හා මුදල් වැය කළ කටයුතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1540/’11

5\.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, හරුමල්ගොඩ බටහිර කණිටු විද්‍යාලයේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?